සවියෙන් පෙරට - අපි එකට
e-ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

09 ශ්‍රේණිය:ඉතිහාසය- 1 වාරය

2 පාඩම- ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය

සැකසුම: ඩී.එම්. ජයසූරිය
බප/හො/දොඹගොඩ සීලරතන ම.වි

2.1
බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවට පැමිණීම හා බලය තහවුරු කර ගැනීම

ඉංග්‍රීසින් මුහුදුබඩ ප්‍රදේශ යටත් කර ගැනීම

- 1498 වර්ෂයේ දී ඉන්දියාවට පැමිණි පෘතුගීසීහු 1505 වර්ෂය වන විටශ්‍රී ලංකාවට පැමිණියහ.

- 17 වන සියවස ආරම්භයේ දී ආසියාවට පැමිණ එම ශතවර්ෂයේ මැද එනම් 1658 වර්ෂය වන විට ශ්‍රී ලංකාවට ද පැමිණි ලන්දේසීහු එවකට පෘතුගීසීන් සතුව පැවති මෙරට මුහුදුබඩ ප්‍රදේශවල තම බලය පිහිටුවීමට කටයුතු කළහ.

බ්‍රිතාන්‍යයන්ගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමු වීමට බලපෑ හේතු

- ශ්‍රී ලංකාවේ පිහිටීමේ වැදගත්කම
- ත්‍රිකුණාමලය වරායේ වැදගත්කම
- වෙළෙඳ කටයුතුවල දී ශ්‍රී ලංකාවේ තිබූ වැදගත්කම

ශ්‍රී ලංකාවේ පිහිටීමේ වැදගත්කම

ඉංග්‍රීසින්ට වැදගත් වීමට බලපෑ ප්‍රධාන හේතු තුනක්

- 18 වන සියවස වන විට ඉන්දියාවේ නැගෙනහිර හා බටහිර වෙරළබඩ ප්‍රදේශවල බලය ගොඩ නගාගෙන සිටි ඉංග්‍රීසින්ට එම ප්‍රදේශ සෙසු යුරෝපීයන්ගෙන් ආරක්ෂා කර ගැනීමේ දී ඉන්දියාවට දකුණින් වෙන ම දූපතක් ලෙස පිහිටි ශ්‍රී ලංකාව විශේෂයෙන් වැදගත් වීම
- ශ්‍රී ලංකාවේ පිහිටීම ඉන්දියාවේ ආරක්ෂාවට පමණක් නොව ඉන්දියානු සාගරයේ නාවික ආධිපත්‍ය පවත්වාගෙන යාමටත් වැදගත් වීම
- පෙරදිග හා අපරදිග වෙළෙඳ මාර්ගවල මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ පිහිටීම

maphill

ත්‍රිකුණාමලය වරායේ වැදගත්කම

- බෙංගාල බොක්කට හා අග්නිදිග ආසියාවට මුහුණ ලා ඇති ස්වාභාවික වරායක් වීම
- රට තුළට නෙරා ගිය ස්වාභාවික වරායක් වූ බැවින් අනතුරුදායක සුළි සුළංවලින් නැව් ආරක්ෂා කර ගත හැකි වීම
- ඉංග්‍රීසින් ඉන්දියානු සාගරයේ දී ප්‍රංශ ජාතිකයන් සමග ගෙන ගිය නාවික සටන්වල දී ත්‍රිකුණාමල වරාය යුධමය අතින් වැදගත් වීම

වෙළෙඳ කටයුතුවල දී ශ්‍රී ලංකාව කෙරෙහි තිබූ වැදගත්කම

- ඉතා උසස් තත්වයේ කුරුඳු හා වෙනත් කුළු බඩු මෙරටින් ලබා ගැනීමට හැකි වීම (උදාහරණ - ගම්මිරිස්, කරාබුනැටි, එනසාල්)
- කුළුබඩු හැරුණු විට අලි ඇතුන් වැනි සතුන් ද මුතු මැණික් වැනි වෙළෙඳාමේ දී වැදගත් වූ ද්‍රව්‍ය රැසක් ද මෙරට පැවතීම
- බ්‍රිතාන්‍යයන් විසින් නිපදවන ලද භාණ්ඩ මෙරට දී අලෙවි කිරීමට වෙළෙඳපොළක් ගොඩනගා ගැනීමට හැකි වීම

1796 වර්ෂයට පෙර ඉංග්‍රීසින් හා උඩරට රාජධානිය අතර පැවති සබඳතා

- එහි ප්‍රතිඵලයක් ලෙස උඩරට රාජ්‍යය හා ඉංග්‍රීසින් අතර ප්‍රධාන දූත ගමන් කිහිපයක් සිදු විය
- 1762 වර්ෂයේ දී ජෝන් පයිබස් කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමු වීම
- 1782 වර්ෂයේ දී හියු බොයිඩ් රාජාධිරාජසිංහ රජු හමු වීම
- 1795 වර්ෂයේ දී රොබට් ඇන්ඩෲස් රාජාධිරාජසිංහ රජු හමු වීම

පෙරදිග ඉන්දියා ඉංග්‍රීසි වෙළෙඳ සමාගම මෙරට මුහුදුබඩ ප්‍රදේශවල බලය පිහිටුවීම

- ඉංග්‍රීසින්ට පෙර මෙරට මුහුදුබඩ ප්‍රදේශ අල්ලාගෙන සිටි ලන්දේසීන්ගේ මව්රට වූයේ ඕලන්දයයි.
- ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රංශය විසින් ඕලන්දය ආක්‍රමණය කොට එහි බලය අල්ලා ගත් හෙයින් ඕලන්ද පාලක පස්වන විලියම් රජතුමා බ්‍රිතාන්‍යයට පලා ගියේය
- මෙසේ ඕලන්දයේ ප්‍රංශ පාලනයක් බිහි වූ හෙයින් ලන්දේසීන් සතු වූ මෙරට මුහුදුබඩ ප්‍රදේශ ද ප්‍රංශවරුන් යටතට පත් වෙතැයි ඉංග්‍රීසීහු බිය වූහ.

- මෙම සිදුවීම තම වාසියට හරවා ගත් බ්‍රිතාන්‍යයන්, ලංකාවේ ලන්දේසි බලකොටුවලට ඉංග්‍රීසි හමුදාව ඇතුළත් කර ගත යුතු යැයි ලිපියක් විලියම් රජතුමාගෙන් ලබා ගත්තේ ය.

- එම ලිපිය එංගලන්තයේ කිව් මාලිගයේ සිට ලියූ බැවින් **කිව් ලිපිය** ලෙස හැඳින්වේ.

කිව් මාළිගය

- එම ලිපිය ලංකාවේ එවකට ලන්දේසි ආණ්ඩුකාරවරයා වූ ෆන් එංගල්බෙක් වෙත ඉදිරිපත් කරනු ලැබුව ද ඔහු ඊට එකඟ නොවී ය.

- එයට ප්‍රතිචාරයක් ලෙස ඉංග්‍රීසීහු යුධමය ක්‍රියාදාමයකට එළඹුණහ. ඒ අනුව ඉංග්‍රීසීහු 1795 අගෝස්තු 26 වන දින ත්‍රිකුණාමලයේ ලන්දේසීන් සතුව පැවති ෆෙඩ්රික් කොටුවට පහර දී අල්ලා ගත්හ.

- අනතුරුව පිළිවෙළින් යාපනය, මන්නාරම, කල්පිටිය හා කොළඹ යන ස්ථානවල පිහිටි සියලු ලන්දේසි බලකොටු තමන් යටතට ගැනීමට ඉංග්‍රීසින්ට හැකි විය.

- 1796 පෙබරවාරි මාසය වන විට ලන්දේසීන් සතුව පැවති සියලුම මුහුදුබඩ ප්‍රදේශ පෙරදිග ඉංග්‍රීසි වෙළෙඳ සමාගම සතු විය.

මුහුදුබඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍ය පාලනයේ කැපී පෙනෙන අවස්ථා

- 1796 -1798 දක්වා පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම යටතේ පාලනය
- 1798 - 1802 දක්වා ද්විත්ව පාලනය
- 1802 සිට බ්‍රිතාන්‍ය කිරීටය යටතේ පාලනය

1797 වර්ෂයේ දී මුහුදුබඩ ප්‍රදේශවල ඇති වූ කැරැල්ල

- 1797 වර්ෂයේ දී පෙරදිග ඉංග්‍රීසි වෙළෙඳ සමාගමේ පාලනයට එරෙහිව මුහුදුබඩ ප්‍රදේශවල ඇති වූ කැරැල්ලට බලපෑ හේතු කිහිපයකි

- ඉංග්‍රීසි වෙළෙඳ සමාගම නව බදු වර්ග කිහිපයක් පැනවීම (උදා - පොල් ගස් බද්ද, ලුණු බද්ද, මාළු බද්ද, දුම්කොළ බද්ද)

- බදු එකතු කිරීමේ දේශීය නිලධාරීන් ඉවත් කොට මදුරාසියෙන් ගෙන්වන ලද අවුමිල්දාර් නම් නිලධාරීන් යෙදවීම නිසා ජනතාව තුළ ඇති වූ විරෝධය සාම්ප්‍රදායිකව තිබූ භාණ්ඩවලින් බදු ගෙවීම වෙනුවට මුදලින් බදු ගෙවීමට සිදු වීම හා මුදල් භාවිතය ප්‍රචලිත නොවූ නිසා ජනතාව ඉන් දැඩි පීඩාවට පත් වීම.

- මහත් අපහසුතා මැද කැරැල්ල මර්දනය කළ බ්‍රිතාන්‍යයෝ එය ඇති වීමට මුල් වූ කරුණු සොයා බැලීම සඳහා කර්නල් මියුරන් යටතේ කොමිසමක් පත් කළහ

- එය **'ද මියුරන් කොමිසම'** නමින් හැඳින්වේ.

- මුහුදුබඩ ප්‍රදේශවල ජන ජීවිතය යථා තත්වයට පත් කිරීම සඳහා මියුරන් කොමිසම විසින් යෝජනා කීපයක් ඉදිරිපත් කරන ලදි.

- එම කොමිසමේ නිර්දේශවලට අනුව වෙළෙඳාමට හුරුව සිටි නිලධාරීන් පරිපාලනයට සම්බන්ධ වීම නිසා මෙවැනි තත්වයක් උද්ගත වූ බව පැහැදිලි කෙරිණ.

- ඒ අනුව වෙළෙඳ කටයුතු හා පරිපාලන කටයුතු වෙන් වෙන් නිලධාරීන් යටතේ සිදු විය යුතු බව කොමිසම විසින් නිර්දේශ කරන ලදි.

- මුහුදුබඩ ප්‍රදේශවල පාලනය ගෙනයාමේ දී ආර්ථික කටයුතු ඉංග්‍රීසි වෙළෙඳ සමාගම විසින්ද දේශපාලන කටයුතු බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ මැදිහත්වීමෙන්ද ගෙන ගිය පාලනය ද්විත්ව පාලනය යනුවෙන් හැඳින්වේ

- මේ අනුව වෙළෙඳ සමාගමට තවදුරටත් වෙළෙඳ කටයුතු හා ආදායම එකතු කර ගැනීමට අවසර ලැබුණු අතර පරිපාලන හා යුද්ධ කටයුතු මෙහෙයවීම සඳහා 1798 වර්ෂයේ දී පෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා පත් කෙරිණි

- ද්විත්ව පාලනය පැවති 1798 - 1802 කාලයේ ආණ්ඩුකාරවරයාගේ නිලධාරින් හා වෙළෙඳ සමාගමේ නිලධාරින් වශයෙන් කොටස් දෙකක් ඇති විය.

මුහුදුබඩ ප්‍රදේශ කිරීට යටත් විජිතයක් වීම

- බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ නායකයා රජු වූ බැවින් ද කිරීටය හෙවත් ඔටුන්න මගින් රජු සංකේතවත් වන බැවින් ද, එය කිරීට යටත් විජිත තත්වයක් වශයෙන් ව්‍යවහාර කෙරේ.

ඉංග්‍රීසින් උඩරට රාජධානිය යටත් කර ගැනීම

- 1803 වර්ෂය වන විට උඩරට රජු හා එහි ජනතාව අතර යහපත් සබඳතාවක් තිබූ හෙයින් එම වසරේ දී ඉංග්‍රීසින් සිදු කළ ආක්‍රමණය මුළුමනින් ම අසාර්ථක විය.

- එහෙත් 1815 වර්ෂය වන විට උඩරට රජුට එහි ජනතාවගේ සහයෝගය නොලැබුණු බැවින් ඉංග්‍රීසින්ගේ අරමුණු ඉටු කර ගැනීමට හැකියාව ලැබුණි.

1803 උඩරට ආක්‍රමණයට හේතු

- ඉංග්‍රීසින් මුහුදුබඩ ප්‍රදේශ පාලනය කරමින් සිටින විට උඩරට වෙන ම ස්වාධීන රාජ්‍යයක් පැවතීම ගැන ඔවුහු සතුටු නොවූහ.

- ඉංග්‍රීසින්ගේ පාලන ප්‍රදේශයේ සිටි ලාංකිකයන් පවා උඩරට පාලකයා තම රජු ලෙස සැලකීම,

- පහතරට ඇති වන ඉංග්‍රීසි විරෝධී කැරලිවලට උඩරට රජු උදව් දෙතැයි ඉංග්‍රීසින් කල්පනා කිරීම,

- ත්‍රිකුණාමලය හා කොළඹ අතර ගොඩබිමින් සබඳතා පැවැත්වීමේ දී උඩරට රාජ්‍යය බාධකයක් වීම,

- බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව උඩරට රජු ප්‍රංශවරුන්ගෙන් ආධාර ලබා ගනු ඇතැයි ඉංග්‍රීසින් බියවීම

1803 උඩරට ආක්‍රමණය අසාර්ථක වීමට හේතු

- ඉංග්‍රීසින්ට පහරදීමට සූදානම් වූ උඩරැටියෝ වර්ෂා කාලය එළඹෙන තෙක් උපක්‍රමශීලීව සටන පමා කිරීම.

- වර්ෂා කාලය එළඹීමත් සමග සටනට පිවිසි උඩරැටියෝ මහනුවර හා කොළඹ අතර සබඳතා පැවැත්වූ ප්‍රධාන මාර්ග සියල්ල අවහිර කරමින් ඉංග්‍රීසි හමුදාවට අවශ්‍ය ආහාර හා යුධ උපකරණ සැපයීම නවතා දැමූහ.

- මේ නිසා නගරයට කොටු වූ ඉංග්‍රීසි හමුදාව ආහාර හිඟකම හා මැලේරියාව වැනි රෝග පීඩාදියෙන් මහත් අසරණ තත්වයකට පත් විය.

උඩරට රාජධානියේ අභ්‍යන්තර බල අරගලය

- රජු හා රදල ප්‍රධානීන් අතර ඇති වූ අර්බුද
- රජු හා භික්ෂූන්වහන්සේලා අතර ඇති වූ අර්බුද
- රදල ප්‍රධානීන් අතර ඇති වූ අර්බුද
- රජු හා සාමාන්‍ය ජනතාව අතර ඇති වූ අර්බුද

රජු හා රදල ප්‍රධානීන් අතර ඇති වූ අර්බුද

- ඇතැම් රදලවරුන්ට පැවරී තිබූ රාජකාරීන් රජු තම ඥාතීන් වූ නායක්කාර වංශිකයන් වෙත පැවරීම
- රට වැසියන්ට හිංසා පීඩා කළ රදලවරුන්ට රජු දඬුවම් පැමිණ වීම
- තමා බලයට පත් කිරීමට ක්‍රියා කළ පිළිමතලව්වේ මහා අධිකාරම්ට මරණ දණ්ඩනය නියම කිරීම

- රදල බලය වර්ධනය වූ ඇතැම් පළාත් කුඩා පරිපාලන ඒකකවලට බෙදා ඒ සඳහා නව නිලධාරින් හා රදලවරුන් පත් කිරීම

  උදාහරණ - සබරගමුව දිසාව කොටස් දෙකකට බෙදීම

- රදලවරුන් අතර අර්බුද ගොඩනැගෙන අයුරින් තනතුරු ලබාදීම

  උදාහරණ - පිළිමතලව්වේගේ මරණයෙන් පසු හිස් වූ මහාධිකාරම් ධුරය සඳහා

- ඇහැළේපොළ පත් කිරීම, ඇහැළේපොළගේ දෙවන අධිකාරම් ධුරයට ඔහුගේ විරුද්ධවාදියෙකු වූ මොල්ලිගොඩ පත් කිරීම.

රජු හා භික්ෂූන්වහන්සේලා අතර ඇති වූ අර්බුද

- පරණාතල කුඩා උන්නාන්සේ ඇතුළු භික්ෂූන් වහන්සේලා කිහිප නමකට රාජ ද්‍රෝහී චෝදනා එල්ල කොට මරණීය දණ්ඩනය පැනවීම
- දළදා මාලිගය අවට සිදු වූ නවීකරණ කටයුතු සඳහා භික්ෂූන් වහන්සේලාගේ එකඟත්වය ලබා නොගැනීම
- බෝගම්බර වැව විශාල කිරීමේ කටයුත්තේ පෝයමළු විහාරයත්, සතර දේවාලත් ඉවත් කිරීමට රජු කළ යෝජනාව බෞද්ධ විරෝධී ක්‍රියාවක් ලෙස භික්ෂූන් වහන්සේලා සැලකීම

රදල ප්‍රධානීන් අතර ඇති වූ අර්බුද

- මොල්ලිගොඩ හා ඇහැළේපොළ අතර ඇති වූ අර්බුද හේතුවෙන් උඩරට රාජ්‍යයේ දේශපාලන එක්සත් භාවය හීන වී යාම

- උඩරට රාජ්‍යයට අයත් පරිපාලන ප්‍රදේශ වල ඇතැම් රදල ප්‍රධානීන් එකිනෙකාට විරුද්ධව ක්‍රියා කිරීම නිසා රජු හා ඔවුන් අතර සබඳතාව ගිලිහී යාම

රජු හා සාමාන්‍ය ජනතාව අතර ඇති වූ අර්බුද

- සබරගමුව ප්‍රදේශයේ ඇති වූ කැරැල්ල පහසුවෙන් මර්දනය කළ නමුත් කැරැල්ලට සම්බන්ධ යැයි සැක කළ සියයකට වැඩි පිරිසකට මරණ දණ්ඩනය පැනවීමට රජතුමා ක්‍රියා කළේ ය.

- තමාට විරුද්ධව කැරලි ගැසූ ඇහැලේපොළ අල්ලා ගැනීමට නොහැකි වීම නිසා රජු ඔහුගේ බිරිඳ හා දරුවන් අත්අඩංගුවට ගෙන අමානුෂික ලෙස දඬුවම් පැමිණවීම මහජනතාවගේ දැඩි කනස්සල්ලට හේතු වී ඇත.

- මහනුවර නගරයේ රාජකාරී සේවයට පැමිණි සබරගමුව, සතර කෝරළය වැනි ප්‍රදේශවල ජනතාවට රාත්‍රී කාලයෙ අගනුවර නවාතැන් ගැනීම රජු තහනම් කර තිබුණි. මෙය එම ප්‍රදේශවල ජනතාවට මහත් හිරිහැරයක් වූ බව වාර්තා වේ. උඩරට භික්ෂූන් වහන්සේලා හා රදල ප්‍රධානීන් කෙරෙහි මහජනතාව තුළ විශාල ගෞරවයක් තිබූ අතර රජු භික්ෂූන් වහන්සේලා ඝාතනය කරවීමත්, රදලවරුන් සැකයට භාජන කිරීමත් මහජනතාව හා රජු අතර සබඳතාව බිඳ වැටීමට ද බලපෑවේ ය.

1815 උඩරට ආක්‍රමණය හා රජු අත් අඩංගුවට ගැනීම

- ජෝන් ඩොයිලිගේ බුද්ධිතොරතුරු මත හා මේ වන විට ඉංග්‍රීසින් වෙත පලා ගොස් සිටි ඇහැලේපොළගේ උපදෙස් මත උඩරට ආක්‍රමණයට වැඩ පිළිවෙළ සැකසිණි
- උඩරැටියන් රජු කෙරෙහි කලකිරී සිටි බැවින් වැසියන්ගේ ආරක්ෂාව සඳහා ඉංග්‍රීසි හමුදා උඩරටට පැමිණෙන බව නිවේදනය කරමින් තම හමුදාව උඩරටට ඇතුළු කිරීමට බ්‍රවුන්රිග් උපායශීලීව ක්‍රියාකළේය
- කොළඹ, ගාල්ල, මීගමුව,ත්‍රිකුණාමලය හා මඩකලපුව යන ප්‍රදේශවලින් පිටත් වූ සේනාංක අටක් මහනුවර බලා පිටත් විය.

- ඉංග්‍රීසි හමුදාව කිසි දු උපද්‍රවයකින් මහනුවරට ඇතුළු වූ අතර මුල දී තමාගේ ආරක්ෂාවට සිටි ජනතාව හා රදලයන් තමා වටා නොමැති බව වටහා ගත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා බිසෝවරුන් දෙදෙනා සමග මැද මහනුවරට පලා ගියේ ය

- මැද මහනුවර බෝමුරේ නැමති ස්ථානයේ සැඟවී සිටි රජු හා බිසෝවරුන් දෙදෙනා අල්ලා ගන්නා ලද්දේ උඩරැටියන් පිරිසක් විසිනි

- ඩොයිලිගේ ආරක්ෂාව යටතට පත් වූ රජු හා බිසෝවරුන් දෙදෙනා පසුව කොළඹට රැගෙන ආ අතර 1816 දී ඉන්දියාවේ වෙල්ලෝරයට පිටුවහල් කරන ලදී

- සිරගතව සිටිය දී ඇති වූ උදරාබාධයක් හේතුවෙන් රජු පසුව මරණයට පත් විය

උඩරට ගිවිසුම අත්සන් කිරීම

- රදලවරුන් සමග ගිවිසුමක් ඇති කර ගැනීමෙන් තමන් ලැබූ ජය තවදුරටත් තහවුරු කර ගැනීමට ඉංග්‍රීසීහු කටයුතු කළහ.

- 1815 වර්ෂයේ මාර්තු 2 වන දින මහනුවර මගුල් මඩුවේ දී ගිවිසුම අත්සන් කිරීමට පෙර ඉංග්‍රීසි භටයෙකු සිංහල කොඩිය පහත දමා ඉංග්‍රීසි කොඩිය ඔසවනු දුටු වාරියපොළ ශ්‍රී සුමංගල හිමියෝ නිර්භීතව ඉදිරියට පැමිණ, ගිවිසුම අත්සන් කිරීමට පෙර ඉංග්‍රීසින්ට මේ රටේ අයිතියක් නැතැයි ප්‍රකාශ කරමින් ඉංග්‍රීසි කොඩිය පහත හෙළා උන්වහන්සේ නැවතත් සිංහල ධජය එසවූ බවට ජනප්‍රවාද පවතී.

උඩරට ගිවිසුම අත්සන් කිරීම

- මාර්තු දෙවන දින ප්‍රකාශයට පත් කරන ලද ගිවිසුම සඳහා බ්‍රිතාන්‍යයේ III ජෝර්ජ් රජු වෙනුවෙන් රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාද උඩරට වෙනුවෙන් රදල ප්‍රධානීහු ද අත්සන් තැබූහ.

- 1815 මාර්තු 10 දින මෙම ගිවිසුමට අත්සන් තැබූ බව ඩොයිලිගේ දින පොතෙන් පෙනේ.

- උඩරට ගිවිසුම ප්‍රධාන වගන්ති 12කින් සමන්විත විය

උඩරට ගිවිසුම ප්‍රධාන වගන්ති 12කින් සමන්විතය

2 වන වගන්තිය

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිහසුනෙන් නෙරපන ලදු බව ද ඔහුගේ සියලු ම ඥාතීන්ට උඩරට සිහසුන පිළිබඳ තිබූ සෑම අයිතිවාසිකමක් ම අහෝසි වූ බව සඳහන් වේ

4 වන වගන්තිය

උඩරට සාම්ප්‍රදායික නිලධාරීන් වූ මොහොට්ටාල, කෝරාල වරුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන බව දැක්වේ.

උඩරට ගිවිසුම ප්‍රධාන වගන්ති 12කින් සමන්විතය

5 වන වගන්තිය

රටවැසියන් අදහන බුද්ධාගම හා දේවාගම් ද භික්ෂූන් වහන්සේලා හා වෙහෙර විහාර ද ආරක්ෂා කරන බව සදහන් වේ.

6,7 වගන්තිය

අංග ඡේදනය වැනි පැරණි දඬුවම් ක්‍රම අහෝසි කරන බව හා මරණ දඬුවම පැමිණවීම ආණ්ඩුකාරවරයාගේ බලය මත සිදු කරන බව දැක්වේ.

1818 නිදහස් සටන

- 1818 සටනට තුඩු දුන් හේතු

- රජෙකු නොමැති වීම නිසා ජනතාව තුළ ඇති වූ කලකිරීම
- බ්‍රිතාන්‍යයන්ගේ පාලනය යටතේ බුදු දහම විනාශ වෙතැයි බියක් ඇති වීම
- දේශීය සම්ප්‍රදායන් හා සිරිත් විරිත් නොසලකා බ්‍රිතාන්‍යයන් සිදු කරනු ලැබූ පරිපාලන හා නීති ප්‍රතිසංස්කරණ නිසා ජන ජීවිතය වියවුල් වීම
- රදළ ප්‍රධානීන්ගේ බලතල, වරප්‍රසාද හා ආදායම් මාර්ග සුරක්ෂිත නොවීම
- 1818 නිදහස් සටන සඳහා බලපෑ ආසන්නතම හේතුව වූයේ බහුතර සිංහල ජනයා
- වාසය කළ වෙල්ලස්සේ මඩිගේ මුහන්දිරම් වශයෙන් හජ්ජි මරික්කාර් නැමති
- මුස්ලිම් ජාතිකයෙකු පත් කිරීම නිසා සිංහල ජනයා අතර ඇති වූ විරෝධයයි

සටන ආරම්භ වීම හා ව්‍යාප්ත වීම

- ඉංග්‍රීසි පාලනය කෙරෙහි උඩරැටියන් තුළ කලකිරීමක් පවතින අතරතුර උඩරට රජු හැටියට පෙනී සිටි දොරේසාමි නැමැත්තෙක් වෙල්ලස්ස ප්‍රදේශයේ සිට ජනතාව සංවිධානය කිරීමට පටන් ගත්තේ ය.

- ඌව ඒජන්තවරයා දොරේසාමි අල්ලා ගැනීම සඳහා හජ්ජි මරික්කාර් ඇතුළු පිරිසක් වෙල්ලස්ස ප්‍රදේශයට යැවූ නමුත් සටන්කාමීන් අතින් හජ්ජි මරික්කාර් මරණයට පත් විය.

- දොරේසාමි අල්ලා ගැනීම සඳහා නැවත වතාවක් බදුල්ලේ උප ඒජන්තවරයා වූ විල්සන් හා ලෙප්ටිනන්ට් නිව්මන් වෙල්ලස්ස බලා පිටත්ව ගිය නමුත් සටන් කරුවන් අතින් විල්සන් මරුමුවට පත් විය.

- ඌව වෙල්ලස්ස සටන සුළුවෙන් නොසැලකිය යුතු බව ඉංග්‍රීසීහු තේරුම් ගත්හ.

- සටන ව්‍යාප්ත වනු දුටු ඉංග්‍රීසීහු ඒ වන විට ඌව දිසාව භාරව සිටි මොනරවිල කැප්පෙටිපොළ එය මර්දනය කිරීමට පිටත් කළහ.

නිදහස් සටනේ නායකයන්

- කැප්පෙටිපොළ නිලමේ
- මඩුගල්ලේ දිසාව
- කිවුලෙගෙදර මොහොට්ටාල
- පිළිමතලව්වේ දෙවන අධිකාරම්
- බුටෑවේ රටේ රාල
- කොහුකුඹුරේ රාල
- කැප්පෙටිපොළ

සටන අසාර්ථක වීම

* විධිමත් ලෙස සංවිධානය වී නොතිබීම

* ඉංග්‍රීසින් විසින් සටන අඩපණ කිරීමට යොදා ගත් දැඩි මර්දනකාරී ප්‍රතිපත්තියට මුහුණදීමට සටන්කරුවන්ට නොහැකි වීම

* සටන මෙහෙයවූ නායකයන් අතර තිබූ පෞද්ගලික අමනාපකම්

* ඉංග්‍රීසින්ගේ ආයුධ ශක්තියට මුහුණදීමට සටන් කරුවන්ට නොහැකි වීම

* රජු ලෙස පෙනී සිටි දොරේසාමි නැමැත්තා නියම දොරේසාමි නොවන බව හෙළි වීම නිසා සටන්කරුවන් අධෛර්යට පත් වීම

සටනේ ප්‍රතිඵල

- සටන මෙහෙයවූ කැප්පෙටිපොළ, මඩුගල්ලේ වැනි නායකයන් යුධ අධිකරණයක් මගින් වැරදිකරුවන් කොට හිස ගසා මරා දැමීම

- ඇහැළේපොළ ඇතුළු තවත් පිරිසක් මුරුසි දිවයිනට පිටුවහල් කිරීම

- 1815 වර්ෂයේ උඩරට ගිවිසුම නොසලකා 1818 උඩරට ප්‍රකාශනය මගින් බ්‍රිතාන්‍ය බලය තහවුරු කර ගැනීම

- උඩරට රදල ප්‍රධානීන්ගේ එතෙක් පැවති බලතල හා වරප්‍රසාද අහෝසි කොට එම බලය ඉංග්‍රීසි නිලධාරීන් වෙත පැවරීම

1848 නිදහස් සටන

- 1848 නිදහස් සටන සඳහා 1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනාවලින් බලපෑමක් ඇති විය

- කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් වතු වගාව ආරම්භ කළ අතර ඒ සඳහා ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක විය

- 1840 වර්ෂයේ පැනවූ ඉඩම් පනත මගින් නීත්‍යානුකූල අයිතිය තහවුරු කළ නොහැකි ඉඩම් රාශියක් රජයට පවරා ගන්නා ලද අතර එමගින් සාමාන්‍ය ජනයාට ගොවිබිම් හා ඉඩම් රාශියක් අහිමි විය

- වතු වගාව කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ ප්‍රමුඛ අවධානය යොමුවීම හේතුවෙන් දේශීය කෘෂි කර්මාන්තය අඩපණ වූ අතර ගොවිතැන් පාළු වී යාම නිසා ග්‍රාමීය ජන ජීවිතය බිඳ වැටීම.
- ග්‍රාමීය ප්‍රදේශයන්හි වැව්, අමුණු හා ඇළ වේලි වල නඩත්තු කටයුතු මෙන්ම ග්‍රාමීය ප්‍රදේශයන්හි සුළු ආරවුල් විසඳන ගම් සභා ක්‍රමය අඩපන වීම නිසා ග්‍රාමීය ජීවන රටාව පිරිහීම

- රජය හා මහජනතාව අතර සමීපතාවය දුරස්වීම හේතුවෙන් මහජනතාවගේ අවශ්‍යතාවයන් සපුරා ලීමට පාලකයින් අපොහොසත් වීම.
- බ්‍රිතාන්‍ය පාලනය යටතේ බුදු දහම නොසලකා හැරීම සහ උඩරට සුරාසැල් ඇති කිරීම හේතුවෙන් සමාජයෙන් සාරධර්ම පිරිහී යෑම.
- ටොරින්ටන් සාමිවරයාගේ නව බදු ප්‍රතිපත්ති

ටොරින්ටන්සාමි විසින් නව බදු වර්ග රැසක් පනවන ලදී.

- මුද්දර බද්ද
- තුවක්කු බද්ද
- වෙළෙඳ සැල් බද්ද
- ඔරුපාරු බද්ද
- බලු බද්ද
- කරත්ත බද්ද

.50
SRI LANKA
COMMONWEALTH DAY 14 MARCH 1983
2.50
SRI LANKA
COMMONWEALTH DAY 14 MARCH 1983
5.00
SRI LANKA
COMMONWEALTH DAY 14 MARCH 1983
20.00
SRI LANKA
COMMONWEALTH DAY 14 MARCH 1983

සටන ආරම්භ වීම

- ටොරින්ටන් සාමිවරයා විසින් පනවන ලද නව බදු වර්ග වලට විරෝධය දැක්වීම සඳහා දැවැන්ත උද්ඝෝෂණයක් දිවයිනේ ප්‍රදේශ රැසක ම ඇති වන්නට විය
- ඇග බද්ද, බලු බද්ද හා තුවක්කු බද්දට එරෙහිව ජනතාව තුළින් දැඩි විරෝධයක් මතු විය
- **1848** ජූලි මස දුම්බර රටේ මහතා වූ මඩුගල්ලේගේ ප්‍රධානත්වයෙන් එවකට මහනුවර ඒජන්තවරයා හමු වීමට ගිය බදු විරෝධීන් පිරිසක් විසුරුවා හැරීමට පැමිණි පොලිස් නිලධාරී ලොකු බණ්ඩා දුණුවිල මහතාට අසු පිටින් වැටෙන තුරු උද්ඝෝෂකයෝ පහර දුන්හ

- මෙසේ ඇති වූ විරෝධය බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි සටනක් බවට පරිවර්තනය වීමට වැඩි කල් ගත නොවී ය
- සටනේ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ මාතලේ ප්‍රදේශයයි. 1848 ජූලි මාසය වන විට මාතලේ, කුරුණෑගල, නුවරකලාවිය, තමන්කඩුව, හාරිස්පත්තුව සටන්කරුවන් අතට පත් වී තිබුණි.
- සටන්කාමීන් මහනුවර අල්ලා ගැනීමට උත්සාහ දැරුව ද එය අසාර්ථක විය

සටනේ නායකයන් කිහිප දෙනෙක්

- ගොංගාලේගොඩ බණ්ඩා හෙවත් පැලියගොඩ ඩේවිඩ්
- පුරන් අප්පු හෙවත් ප්‍රැන්සිස්කෝ
- කිංගිරාල

වීරපුරන් අප්පු
1948... A Year of Revolution around the world......


සටන අසාර්ථක වීම

- ආණ්ඩුවේ නව බදු ප්‍රතිපත්තියට එරෙහිව උඩරට මෙන්ම පහතරට ප්‍රදේශවලින්ද විරෝධතා මතු වුවත් 1848 සටන උඩරට ප්‍රදේශ කිහිපයක පමණක් පැතිරිණ.
- සටන ආරම්භයේ දී ම සිය හමුදා උපායශීලීව මෙහෙයවමින් ඉංග්‍රීසීහු එය ව්‍යාප්ත වීම පාලනය කර ගත්හ.
- මාතලේ, කුරුණෑගල, මහනුවර වැනි ප්‍රදේශ කිහිපයකට පමණක් සටන සීමා විය.

- ආණ්ඩුකාර ටොරින්ටන් සාමිවරයා මාර්ෂල් ලෝ හෙවත් යුධ නීතිය පනවා දින කිහිපයක් ඇතුළත සටන මර්දනය කොට සටන මෙහෙයවූ නායකයන් අත්අඩංගුවට ගැනීමට කටයුතු කළේ ය.
- කඩහපොළ හිමි, පුරන් අප්පු සහ ඩිංගිරාල යුධ අධිකරණයක් මගින් වරදකරුවන් කොට වෙඩි තබා ඝාතනය කරන ලදි
- ගොංගාලේගොඩ බණ්ඩාට කස පහර දී රටින් පිටුවහල් කෙරිණ'

සටනේ ප්‍රතිඵල

- සටන අවසානයේ ඊට හේතු සොයා බැලීම සඳහා බේලි මහතාගේ මූලිකත්වයෙන් කමිටුවක් පත් කිරීම
- කමිටුවේ යෝජනා අනුව ටොරින්ටන් ආණ්ඩුකාරවරයා හා යටත් විජිත භාර ලේකම් එමර්සන් ටෙනන්ට් එම තනතුරුවලින් ඉවත් කොට එංගලන්තයට ආපසු කැඳවීම
- වෙළෙඳසැල් බද්ද සහ බලු බද්ද අවලංගු කරන ලද අතර මුද්දර බද්ද, තුවක්කු බද්ද, ඇග බද්ද සංශෝධනය කිරීම
- කෘෂිකර්මාන්ත හා වාරිමාර්ග කටයුතු දියුණු කිරීම සඳහා රජය පියවර ගැනීම
- දළදා වහන්සේගේ භාරකාරත්වය නැවත වතාවක් බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතට ගැනීම

බ්‍රිතාන්‍යයන් යටතේ ඇති වූ ආර්ථික වර්ධනය

- තමන් යටත් කර ගන්නා රටවල පවතින සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගෙන හැකි තරම් ලාභ උපයා ගැනීම, බ්‍රිතාන්‍ය යටත් විජිත ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණයක් විය.

- 1815 දී උඩරට රාජ්‍යය ඇතුළුව සමස්ත දිවයිනේ ම බලය අල්ලා ගැනීමෙන් පසුව මෙරට පැවති සාම්ප්‍රදායික කෘෂි ආර්ථික රටාව තුළින් තමන් බලාපොරොත්තු වන ප්‍රතිලාභ අත් කර ගත නොහැකි බව ඉංග්‍රීසීහු තේරුම් ගත්හ

- ඒ අනුව සිය ආදායම් වැඩි කර ගැනීම සඳහා ආර්ථික ප්‍රතිසංස්කරණයන් සිදු කළ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් වාණිජ ආර්ථික භෝග හෙවත් වතු වගාව කෙරෙහි යොමු වූ ආකාරය දක්නට ලැබේ.

වතු වගාවේ උන්නතියට බලපෑ කෝල්බෲක් යෝජනා

- රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම දේශීය හා විදේශීය පෞද්ගලික ව්‍යාපාරිකයන්ට ඉඩම් මිල දී ගැනීමට අවස්ථාව සලසා දීම.
- පෞද්ගලික ව්‍යාපාරික අරමුණුවලට ගැළපෙන ලෙස ප්‍රතිපත්ති සකස් කිරීම
- දේශීය හා විදේශීය පෞද්ගලික ව්‍යාපාරිකයන්ට ඉඩම් මිල දී ගැනීමට අවස්ථාව සලසා දීම.

- පරිපාලන වියදම් අඩු කර ගැනීම සඳහා ඇතැම් දෙපාර්තමේන්තු වසා දැමීම හා ඇතැම් ඒවා ඒකාබද්ධ කිරීම.
- සිවිල් සේවකයන් සංඛ්‍යාව අඩු කිරීම හා ඔවුන්ගේ වැටුප් අඩු කිරීම.
- උඩරට හා පහතරට ඒකාබද්ධ කොට පාලනය කිරීම.
- ඉහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීමෙන් රජයේ වියදම අඩු කර ගැනීමට අපේක්ෂා කෙරිණි.

රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය

- වතු වගාව සඳහා අවශ්‍ය ඉඩම් ලබා ගැනීම පිණිස 1840 දී පනවන ලද ඉඩම් පනත මගින් උඩරට ගැමියන් පාරම්පරිකව භුක්තිවිඳි නීත්‍යනුකූල ලියකියවිලි නොමැති ඉඩම් රජයට පවරා ගන්නා ලදි. එසේ පවරා ගත් ඉඩම් දේශීය හා විදේශීය ඕනෑ ම අයෙකුට කැමති ප්‍රමාණයක් මිල දී ගැනීමට හැකි වන අයුරින් ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කෙරිණ.

- ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය තුළින් දේශීය හා විදේශීය වැවිලිකරුවන්ට හැකි තරම් අඩු මිලට මෙරට ඉඩම් මිල දී ගැනීමට හැකියාව ලැබුණි

- විදේශිකයන්ට මෙරට ඉඩම් මිල දී ගැනීමට හා පදිංචි වීමට සීමා කර තිබූ නීති රීති ඉවත් කරන ලදි.

- ඒ අනුව විදේශීය වතු වැවිලිකරුවෝ ශ්‍රී ලංකාවට පැමිණ වතු වගාව සඳහා මුදල් ආයෝජනය කළහ.

පෞද්ගලික ව්‍යාපාරික අරමුණුවලට ගැළපෙන ලෙස ප්‍රතිපත්ති සකස් කිරීම

- ව්‍යවස්ථාදායක සභාව නියෝජනය කිරීමට යුරෝපීය ව්‍යාපාරික ප්‍රජාවට අවස්ථාව සැලසීම.
- කුරුඳු, ලුණු ආදිය විකිණීමට රජය සතුව පැවති ඒකාධිකාරය අවලංගු කිරීම.
- කැමරන්ගේ අධිකරණ ප්‍රතිසංස්කරණ
- තැන්පත් බැංකුවක් පිහිටුවීමට කටයුතු කිරීම
- රාජකාරි ශ්‍රම ක්‍රමය අවලංගු කිරීම

වතු වගාවේ දියුණුව

කෝපි වගාව

- බ්‍රිතාන්‍යයන් යටතේ මෙරට වගා කරන ලද ප්‍රථම ආර්ථික බෝගය වූයේ කෝපි වගාවයි
- බ්‍රිතාන්‍යයන් පැමිණීමට පෙර කෝපි ගෙවතු වගාවක් වශයෙන් පැවතුණා ද එය වෙළෙඳ බෝගයක් වශයෙන් වගා නොකෙරුණි
- 1822 වර්ෂයේ දී ජෝර්ජ් බර්ඩ් නැමැත්තා ගම්පොළ සිංහ පිටියේ දී ප්‍රථම වරට කෝපි වත්තක් ආරම්භ කළ බව පිළිගැනේ
- 1824 දී එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරවරයා විසින් ගන්නෝරුවේ සිය පෞද්ගලික ඉඩමක කෝපි වත්තක් ආරම්භ කරන ලදි.

මෙරට කෝපි වගාව දියුණුවට බල පෑ හේතු කිහිපයක් වේ

- යුරෝපීය රටවල කෝපි පානය ජනප්‍රිය වීම නිසා කෝපිවලට තිබූ ඉල්ලුම ඉහළයාම හේතුවෙන් කෝපි වගාවෙන් විශාල වශයෙන් ලාභ ලැබීමට හැකිවීම.
- අඩු වියදමකින් ඉතා උසස් තත්වයේ කෝපි මෙරට වගා කිරීමට හැකි වීම.
- කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලින් පසු ව්‍යාපාරිකයන් විශාල ප්‍රමාණයක් කෝපි වතු ආරම්භ කිරීම.
- මෙරටින් එංගලන්තයට අපනයනය කළ කෝපිවලට තීරු බදු අඩු කිරීම

කෝපි වගාව 1848න් පසු පරිහානියට බලපෑ හේතු කිහිපයක් මෙසේ ය.

- ජාවා වැනි අග්නිදිග ආසියානු රටවලින් යුරෝපීය වෙළෝදපොළට කෝපි අපනයනය කිරීම නිසා ශ්‍රී ලංකාවේ කෝපි සඳහා ඉල්ලුම අඩු වීම.
- 1848 පසු ඇති වූ ලෝක ආර්ථික අර්බුදයේ බලපෑම
- 1869 සිට හෙමලියා වෙස්ටර්ක්ස් නම් දිලීර රෝගය වැළදීම නිසා කෝපි වතු විශාල ප්‍රමාණයක් විනාශ වීම.

සවියෙන් පෙරට අපි එකට
e - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය 9	විෂයය ඉතිහාසය	වාරය 1	පාඩම 2. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය - ඇගයීම

සැකසුම - ඩී.එම් ජයසූරිය
බප/හො/දොඹගොඩ සීලරතන ම.වි

01. පෘතුගීසීන් ඉන්දියාවට හා ලංකාවට පැමිණි වර්ෂ පිළිවෙලින් නම් කරන්න.

02. ශ්‍රී ලංකාවේ පිහිටීම ඉංග්‍රීසීන්ට වැදගත් වීමට බලපෑ හේතු මොනවාද?

03. ශ්‍රී ලංකාවේ පිහිටීම ඉංග්‍රීසීන්ට වැදගත් වූයේ කෙසේද?

04. ඉංග්‍රීසීන්ට ත්‍රිකුණාමල වරාය වැදගත් වූයේ ඇයි?

05. උඩරට රාජ්‍ය හා ඉංග්‍රීසීන් හමුවීමට සිදු වූ ප්‍රධාන දූත ගමන් මොනවාද?

06. කිව් ලිපිය යනු කුමක්ද?

07. **1797** වර්ෂයේ දී මුහුදු බඩ ප්‍රදේශවල ඇති වූ කැරැල්ලට ප්‍රධාන වශයෙන් හේතු වූ කරුණ මොනවාද?

08. ද මියුරන් කොමිසම යනු කුමක් ද?

09. ද්විත්ව පාලනය යනු කුමක්ද?

10. ක්‍රි ව 1803 උඩරට ආක්‍රමණයට තුඩු දුන් හේතු මොනවාද?

සවියෙන් පෙරට අපි එකට
e - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය 9	**විෂයය** ඉතිහාසය	**වාරය** 1	**පාඩම** 2. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය - පිළිතුරු

සැකසුම - ඩී.එම් ජයසූරිය
බප/හො/දොඹගොඩ සීලරතන ම.වි

01. 1498 / 1505

02. ශ්‍රී ලංකාවේ පිහිටීමේ වැදගත්කම / ත්‍රිකුණාමලය වරායේ වැදගත්කම /වෙළෙඳ කටයුතුවල දී ශ්‍රී ලංකාවේ තිබූ වැදගත්කම

03. 18 වන සියවස වන විට ඉන්දියාවේ නැගෙනහිර හා බටහිර වෙරළබඩ ප්‍රදේශවල බලය ගොඩනගාගෙන සිටි ඉංග්‍රීසින්ට එම ප්‍රදේශ සෙසු යුරෝපීයන්ගෙන් ආරක්ෂා කර ගැනීමේ දී ඉන්දියාවට දකුණින් වෙන ම දූපතක් ලෙස පිහිටි ශ්‍රී ලංකාව විශේෂයෙන් වැදගත් වීම / ශ්‍රී ලංකාවේ පිහිටීම ඉන්දියාවේ ආරක්ෂාවට පමණක් නොව ඉන්දියානු සාගරයේ නාවික ආධිපත්‍ය පවත්වාගෙන යාමටත් වැදගත් වීම /පෙරදිග හා අපරදිග වෙළෙඳ මාර්ගවල මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ පිහිටීම

04. බෙංගාල බොක්කට හා අග්නිදිග ආසියාවට මුහුණ ලා ඇති ස්වාභාවික වරායක් වීම / රට තුළට නෙරා ගිය ස්වාභාවික වරායක් වූ බැවින් අනතුරුදායක සුළි සුළංවලින් නැව් ආරක්ෂා කර ගත හැකි වීම / ඉංග්‍රීසින් ඉන්දියානු සාගරයේ දී ප්‍රංශ ජාතිකයන් සමග ගෙන ගිය නාවික සටන්වල දී ත්‍රිකුණාමල වරාය යුධමය අතින් වැදගත් වීම

05. 1762 වර්ෂයේ දී ජෝන් පයිබස් කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමු වීම
1782 වර්ෂයේ දී හියු බොයිඩ් රාජාධිරාජසිංහ රජු හමු වීම
1795 වර්ෂයේ දී රොබට් ඇන්ඩෘස් රාජාධිරාජසිංහ රජු හමු වීම

06. ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රංශය විසින් ඕලන්දය ආක්‍රමණය කොට එහි බලය අල්ලා ගත් හෙයින් ඕලන්ද පාලක පස්වන විලියම් රජතුමා බ්‍රිතාන්‍යයට පලා ගියේ ය. මෙසේ ඕලන්දයේ ප්‍රංශ පාලනයක් බිහි වූ හෙයින් ලන්දේසීන් සතු වූ මෙරට මුහුදුබඩ ප්‍රදේශ ද ප්‍රංශවරුන් යටතට පත් වෙතැයි ඉංග්‍රීසීහු බිය වූහ. මෙම සිදුවීම තම වාසියට හරවා ගත් බ්‍රිතාන්‍යයන්, ලංකාවේ ලන්දේසි බලකොටුවලට ඉංග්‍රීසි හමුදාව ඇතුළත් කර ගත යුතු යැයි ලිපියක් විලියම් රජතුමාගෙන් ලබා ගත්තේ ය. එම ලිපිය එංගලන්තයේ කිව් මාලිගයේ සිට ලියූ බැවින් **කිව් ලිපිය** ලෙස හැඳින්වේ.

07. ඉංග්‍රීසි වෙළෙඳ සමාගම නව බදු වර්ග කිහිපයක් පැනවීම (උදා - පොල් ගස් බද්ද, ලුණු බද්ද, මාළු බද්ද, දුම්කොළ බද්ද) / බදු එකතු කිරීමේ දේශීය නිලධාරීන් ඉවත් කොට මදුරාසියෙන් ගෙන්වන ලද අවුම්ල්දාර් නම් නිලධාරීන් යෙදවීම නිසා ජනතාව තුළ ඇති වූ විරෝධය / සාම්ප්‍රදායිකව තිබූ භාණ්ඩවලින් බදු ගෙවීම වෙනුවට මුදලින් බදු ගෙවීමට සිදු වීම හා මුදල් භාවිතය ප්‍රචලිත නොවූ නිසා ජනතාව ඉන් දැඩි පීඩාවට පත් වීම.

08. කැරැල්ල මර්දනය කළ බ්‍රිතාන්‍යයෝ එය ඇති වීමට මුල් වූ කරුණු සොයා බැලීම සඳහා කර්නල් මියුරන් යටතේ කොමිසමක් පත් කළහ. එය **'ද මියුරන් කොමිසම'** නමින් හැඳින්වේ.

09. මුහුදුබඩ ප්‍රදේශවල පාලනය ගෙනයාමේ දී ආර්ථික කටයුතු ඉංග්‍රීසි වෙළෙඳ සමාගම විසින් ද දේශපාලන කටයුතු බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ මැදිහත්වීමෙන් ද ගෙන ගිය පාලනය ද්විත්ව පාලනය යනුවෙන් හැඳින්වේ.

10. ඉංග්‍රීසින්ගේ පාලන ප්‍රදේශයේ සිටි ලාංකිකයන් පවා උඩරට පාලකයා තම රජු ලෙස සැලකීම, පහතරට ඇති වන ඉංග්‍රීසි විරෝධී කැරලිවලට උඩරට රජු උදව් දෙතැයි ඉංග්‍රීසින් කල්පනා කිරීම, ත්‍රිකුණාමලය හා කොළඹ අතර ගොඩබිමින් සබඳතා පැවැත්වීමේ දී උඩරට රාජ්‍යය බාධකයක් වීම, බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව උඩරට රජු ප්‍රංශවරුන්ගෙන් ආධාර ලබා ගනු ඇතැයි ඉංග්‍රීසින් බියවීම